**මාතර ප්‍රාදේශීය සභාව - 2022**

**--------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මාතර ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මාතර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.
-

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට මෝටර්රථ හා කරත්තවල වටිනාකම රු.22,398,100 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු විවිධ වියදම් රු.105,979 ක් වෙනුවෙන් විවිධ ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සභාව සතු රු. 2,291,507 ක් වටිනා ඉඩම් කැබලි 03 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඈ) | ඉකුත් වර්ෂයේදී සභාව සතු කනත්තගොඩ ආදාහනාගාරය සංවර්ධනය කිරීම වෙනුවෙන් දරන ලද රු.1,896,966 ක වියදම ඉඩම් හා ගොඩනැඟිලි යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී සභාවේ සේවය කරන නිලධාරියෙකුගෙන් වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් අයවිය යුතු රු.225,501 ක මුදල අය විය යුතු ආදායමක් ලෙස නොපෙන්වා නොගෙවූ වැටුප් ගිණුමට බැර කර තිබුණි. | නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු වියදම සඳහා ණයහිමි ප්‍රතිපාදන සැලැස්වීමේදි රු.172,628 ක් වැඩිපුර ප්‍රතිපාදන සලස්වා තිබුණි. | නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (උ) | සමාලෝචිත වර්ෂයේදී දීයගහ බටහිර බලශක්ති මාර්ගය සංවර්ධනය කිරීම වෙනුවෙන් ලැබිය යුතු රු.478,216 ක කර්මාන්ත ණයගැතියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඌ) | ස්ථාවර වත්කම් ස්වරූපයේ නොවන රු.431,466 ක් වටිනා ඉන්වෙන්ට්‍රි අයිතම 26 ක් යන්ත්‍ර හා උපකරණ සහ ලී බඩු හා සවිකිරිම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.55,051,901 ක් වූ මෝටර් රථ හා කරත්ත ගිණුමේ සඳහන් ශේෂය හා ඊට අදාළ උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂය අතර රු.1,108,449 ක අසමානතාවයක් පැවතුණි. | නිවැරදි කරන බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂණ වාර්ථා, තක්සේරු වාර්ථා හා උපලේඛන යනාදී තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 111,236,456 ක් වූ ගිණුම් විෂයයන් 24 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු.7,180,069 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු. 26,218,678 විය.

**2.2 මූල්‍ය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් බැංකුවේ පවත්වා ගෙන යනු ලබන කර්මාන්ත ජංගම ගිණුමෙහි වර්ෂ ගණනාවක් තිස්සේ රු.5,000,000 ක් නිසි ආයෝජනයක නොයොදා නිෂ්කාර්යව පැවතුණු බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී මෙය හඳුනා ගැනීමට කටයුතු කරන බව. | අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. |

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 9,126,000 | 5,031,253 | 4,912,719 | 9,319,424 | 8,136,000 | 13,254,550 | 12,241,359 | 9,200,890 |
| (ii) | කුලී | 4,880,100 | 1,936,974 | 2,173,620 | 612,400 | 3,390,100 | 2,074,093 | 1,881,140 | 849,046 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,117,100 | 1,410,800 | 1,466,484 | 161,800 | 3,671,950 | 1,340,384 | 3,045,673 | 217,484 |
| (iv) | වෙනත් ආදායම් | 7,698,000 | 3,015,369 | 3,292,893 | 6,599,252 | 10,694,000 | 13,173,487 | 8,199,334 | 6,876,776 |
| | | 25,821,200 | 11,394,396 | 11,845,716 | 16,692,876 | 25,892,050 | 29,842,514 | 25,367,506 | 17,144,196 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ අදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් හා බදු ශේෂය රු.9,200,890 ක් වූ අතර වරිපනම් ඒකක 5,209 කට අදාළව බිල් කිරීම් රු.5,031,253 ක් සමඟ රු.14,232,143ක් අය විය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.4,912,719 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.9,319,424 හිඟ ශේෂයක් විය. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට සභාව සතු කඩකුලී ගෙවන කඩ කාමර 21 ක් තිබු අතර, එම කඩ කාමරවලින් කඩ කාමර 11 කින් රු. 399,895 ක හිඟ ආදායමක් අය විය යුතුව පැවතුණි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක බලපත්‍ර ගාස්තු හිඟය රු. 217,484 ක් වූ අතර වර්ෂය අවසානයට එය රු.161,800 ක් විය. | හිඟ මුදල් අය කර ගැනීම සඳහා නඩු පවරා ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකළ යුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වෙනත් ආදායම් රු.6,599,252 ක් විය. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකළ යුතු වේ. |
| (ඉ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ රු.3,000,000 ක් හා මුද්දර ගාස්තු රු.27,386,848 ක් අය විය යුතුව තිබුණි. | පෙන්වා ඇති ශේෂය අවසන් ගිණුම සැකසීමේදී වර්ෂයට ලැබේයැයි ඇස්තමේන්තු කරන ලද මුදල බව. | හිඟ ආදායම් කඩිනමින් අයකළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1978 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(viii) වගන්තිය ප්‍රකාර නාගරික නොවන ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල ගොඩනැඟිලි ඉදිකිරීම සම්බන්ධයෙන් සැලසුම් හා සංවර්ධන රෙගුලාසි ඇතුළත් අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා සැකසීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා සැකසීමට කටයුතු කළ යුතු වේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 82 (1) වගන්තියේ විධිවිධාන උපයෝගී කර ගෙන 2022 ජුනි 03 වන දින සභාව විසින් යෝජනා සම්මත කර, සභා අරමුදලින් රු. 172,537 ක් වැය කර පෞද්ගලික ඉඩමක කාණුවක් ඉදිකර තිබූ අතර ඉන් අඩක් එක් පෞද්ගලික පාර්ශවයකින් අය කර තිබුණි. සභාව විසින් ගැටළුව සඳහා විකල්ප විසඳුම් ලබාදීමට කටයුතු නොකිරීම නිසා අනෙක් පාර්ශවය විසින් සභාවට එරෙහිව අධිකරණමය ක්‍රියාමාර්ගයක්ද ගෙන තිබුණි. | සභා අරමුදල් වැයකර සිදු කරන ලද ඉදි කිරීමට අදාලව එක් පාර්ශවයක් වෙතින් අයකර ගැනීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවට ගෙවතු වගාවට පැළ බෙදාහැරීම් ලේඛනය අනුව මිලදී ගත් පැළ වලින් රු.129,383 ක් වටිනා පැළ 7,514 ක ප්‍රමාණයක ඉතිරියක් පවතින බව විගණනයට නිරීක්ෂණය වූවද එම පැළ භෞතික පරීක්ෂාවට විගණනය වෙත ඉදිරිපත් නොවුණි. | ඉදිරි ව්‍යාපෘති වලදී මෙවැනි හානි ප්‍රතිශතය අඩු කර ගැනීමට කටයුතු කරන බව. | හානි අවම වන පරිදි කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ අංක PR/01/01 දරන හා 2010 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව වීථි පහන් ස්ථාපනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී වීථි පහන් වෙනුවෙන් දරන ලද රු.236,400 ක වියදම් විදුලිබල මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය වී නොතිබුණි. | විදුලිබල මණ්ඩලය වෙත ඉල්ලීම් කර ඇති බව. | ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | සභාව සතු මාර්ගවල තුන්වන පාර්ශවයක් විසින් ජලනල එළීම සඳහා පළුදු කරන ලද මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2018 වර්ෂයේ සිට ලැබී තිබුණු රු.1,465,913 ක් අදාළ කාර්යය නියමිත පරිදි ඉටුකරවා ගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | තැම්පතු වලින් කොටසක් ගෙවා අවසන් කර ඇති බව. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ සංවර්ධන බලපත්‍රයක් ලබා ගැනීමකින් තොරව ඉදිකිරීම් 4 ක් සිදුකර තිබූ අතර, සභාව විසින් මේ සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/ රෙගුලාසි ඇතුළත් 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ 2 වන උප ලේඛනය ප්‍රකාරව කටයුතු කර රු. 336,110 ක ගාස්තු අය කර නිත්‍යානුකූල කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | නීතිමය කටයුතු සිදු කරනු ලබන බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 මහජන ක්‍රීඩාංගන සංවර්ධන වැඩ සටහන යටතේ තල්පාවිල කුරුඳුවත්ත ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමේ I අදියර යටතේ කොන්ත්‍රාත්කාර සමිතියට රු.1,213,968 ගෙවා තිබූ අතර බිල්පතේ 1:1 හා 1:2 අයිතම සඳහා දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දී තිබූ නියමිත රේටයන් භාවිතා නොකිරීම නිසා රු.236,567 ක් වැඩිපුර ගෙවා තිබුණි. | කරුණු සොයා බලා ඉදිරියේදී කටයුතු කරන බව. | නියමිත රේටයන් භාවිතා කළ යුතු වේ. |
| (ආ) | 2021 ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ පෞද්ගලික පාරක් කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීම සඳහා සභාව විසින් අවිධිමත් ලෙස රු.253,069 ක වියදමක් දරා තිබුණි. | කරුණු සොයා බලා ඉදිරියේදී කටයුතු කරන බව. | කොන්ත්‍රාත් විධිමත් පරිදි ක්‍රියාත්මක කළ යුතු වේ. |